ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

උපදේශනය හා මාර්ගෝපදේශනය - **ESU 3114**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.09.02 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද 2 වන කොටසින් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. වර්තමානයේ උපදේශන ක්‍රියාවලිය සංවර්ධනාත්මක ක්‍රියාවලියක් ලෙස විස්තර වන්නේ මන්දැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න.

02. උපදේශන න්‍යායට අදාල ප්‍රවේශ පහ නම් කරන්න.

03. පුද්ගලයෙකු මුහුණපාන මානසික ගැටලු හේතුවාදී ප්‍රවේශය තුළ විශ්ලේෂණය කර ඇත්තේ කෙසේදැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න.

04. සමායෝගී පෞරුෂ ගොඩනගා ගැනීමට ඇති බාධක 3 ක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. උපදේශන සේවය සඳහා සච්චාරිත්‍ර ධර්ම මාලාවක් තිබීමේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

06. එලී ගින්ස්බර්ග් ගේ න්‍යායට අනුව වෘත්තිය තේරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථා තුන නම් කරන්න.

07. මධ්‍යගතව සංවිධානය වී ඇති පාසල් මාර්ගෝපදේශ සේවාවක වාසි 3 ක් දක්වන්න.

08. දරුවන් තුළ විනාශකාරී චර්යාවන් ඇතිවීමට බලපෑ හැකි පාසල ආශ්‍රිත සාධක පහක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. i. මාර්ගෝපදේශන සංකල්පය උපදේශන සංකල්පය දක්වා විහිදී ගියේ කෙසේදැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. උපදේශන ක්‍රියාවලිය මාර්ගෝපදේශන ක්‍රියාවලියට වඩා පුළුල් හා විද්‍යාත්මක එකක් ලෙස සලකන්නේ මන්දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. i. උපදේශනය පිළිබඳව සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ මනෝ විශ්ලේෂණ න්‍යාය සාරාංශගත කරන්න. (ලකුණු 05)

ii. අවිඥානික සාධක සමායෝගී පෞරුෂයක් ගොඩනැගීමට බාධාකාරී වන්නේ කෙසේ දැ'යි උදාහරණ 3 ක් ඇසුරින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

iii. ළමුන් තුළ සෘණාත්මක අවිඥානික බලපෑම් අවම වනසේ දෙමාපියන් හෝ ගුරුවරුන් ක්‍රියාකල යුත්තේ කෙසේදැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 07)

11. " 'තමාට කිසිවකු ආදරය නැතැයි' යන හැඟීම සහිත සිසුන් සඳහා දිරිගැන්වීම විශේෂයෙන්ම අත්‍යාවශ්‍ය වේ."

උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

12. i. ඉගෙනුම ආශ්‍රිතව ළමුන් මුහුණපාන ගැටළු 5 ක් ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

ii. එම ගැටළුවලට පසුබිම් වූ හේතු මොනවා ද? (ලකුණු 07)

iii. ඉහත දැක්වූ ලැයිස්තුවෙන් එක් ගැටලුවක් තෝරාගෙන එම ගැටලුව විසඳා ගැනීමට ළමයෙකුට ඔබ සහය වන්නේ කෙසේදැ'යි විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

13. "අධ්‍යාපනය හා වැඩ ලෝකය අතර පවතින නොගැලපීම නැති කිරීම සඳහා පාසල් තුල වෘත්තීය උපදේශන සේවාවක් තිබීම අත්‍යාවශ්‍ය වේ."

උක්ත ප්‍රකාශය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 20)

14. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් සඳහා සටහන් ලියන්න.

1. ප්‍රමාණන පරිමාණ
2. මනෝ විද්‍යා අධ්‍යයන ආයතන
3. ඇල්බට් එලිස්
4. ද්විතීයික පාසල් සිසුන්ගේ උපදේශන අවශ්‍යතා

(ලකුණු 10 x 2 = 20)

\- හිමිකම් ඇවිරිණි. -